Alcohol and Drug Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**මාධ්‍ය නිවේදනය: 'ලෝක මත්ද්‍රව්‍ය විරෝධී දිනය' – 26.06.2023**

ශ්‍රී ලංකාව තුළ ගංජා භාවිතය නීතිගත කිරීම සඳහා විවිධ උත්සහයන් පසුගිය වසර කිහිපය තුළ සිට ඉතාමත් සූක්ෂම අයුරින් ක්‍රියාත්මක වන බව පැහැදිලි ය. ගංජා අපනයනය සඳහා ශක්‍යතාවක් ඇතිද යන්න සොයා බැලීම සඳහා කමිටුවක් ජනාධිතිතුමා විසින් පත් කර ඇති අතර එහි නිර්දේශ මත ආයොජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස ඒ සඳහා අවසර ලබා දෙන බව දිලුම් අමුණුගම අමාත්‍යතුමා පසුගිය දා මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරන ලදි.

ඔවුන්ගේ ප්‍රධාන අරමුණ ලෙස ඔවුන් ප්‍රකාශ කරන්නේ ගංජා අපනයනය කර දැවැන්ත ආර්ථික වාසියක් අත්පත් කරගැනිමට හැකි බවත් එමගින් විදේශ විනිමය රටට අත්පත් කරගත හැකි බවත් ය. නමුත් ඔවුන් ප්‍රකාශ කරන ආර්ථික වාසි බොහෝ විට සත්‍යයෙන් තොර වේ. එම තර්කවල අසත්‍යය බව ගංජා සමාගම්වල ගිණුම් වාර්තා විමසා බැලීමෙන් මනාව විද්‍යාමාන වේ.

ලෝකයේ විශාලතම ගංජා සමාගම් පාඩු ලබන ආකාරය.

| Company | 2021 | 2020 |
|---|---|---|
| Canopy | -1,520 m | -1,700 m |
| Curaleaf | -102 m | -21.7 m |
| Trilay | -336 m | -100 m |
| Aurora | -550 m | -3,300 m |
| Cronos Group | -391 m | -321 m |
| OrganiGram | -130 m | -136 m |

References: Financial websites quoting stock market filings

අන්තර්ජාතික ගංජා වෙළඳපොළ මේ වනවිට කඩා වැටී ඇත. ලෝකයේ විශාලතම බහු ජාතික ගංජා සමාගම් ඩොලර් බිලියන ගණන්වලින් පාඩු ලබන්නේ වසර කිහිපයක සිටය.

ගංජා ප්‍රවර්ධනය බලාපොරොත්තු වන පාර්ශව විසින් ශ්‍රී ලංකාවේ වැසියන් දැනට මුහුණ දෙමින් සිටින බලවත් ආර්ථික අර්බුදය සිය වාසියට හරවා ගෙන ඒ හරහා තම අරමුණු මුදුන්පත් කර ගැනීමේ වැයමක නිරත වී ඇති බව ඉතා පැහැදිලිය.

දැනට ගංජා පිළිබඳව ඇති ධනාත්මක මතවාද හේතුවෙන් ගංජා භාවිතය තව දුරටත් ප්‍රචලිත වන බව ඉතා පැහැදිලිය. මෙවන් වාතාවරණයක ගංජා වැනි හානිකර මත්ද්‍රව්‍යයන් ප්‍රචලිත කෙරෙන විට වෙනත් මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාමද සාමාන්‍යයෙන් සිදුවන කරුණකි.

මේ නිසා ළමුන් සහ තරුණයන් මෙවැනි මත්ද්‍රව්‍යවලට පෙලඹීමේ ප්‍රවණතාවය වැඩි වන අතර අප රට තුළ තිබෙන මත්ද්‍රව්‍ය ගැටළු තව තවත් උග්‍ර වීමට මෙම තත්වය හේතු වේ. ගංජා භාවිතයෙන් මනසට සැනසීම සහ වෙනත් වාසි අත්වන බව පැවසුවත් ගංජා භාවිතය නිසා භින්නෝද්මාදය වැනි දරුණු මානසික රෝග සහ විවිධ රෝගාබාධවලට ලක් වීමත් දක්නට ලැබේ.

තවද ජාත්‍යන්තර දුම්කොළ සමාගම් මේ වන විට ගංජා ව්‍යාපාරයක් ලෙස ලොව පුරා ක්‍රියාත්මක කිරීමට මුදල් යොදවන බවට හෙළි වී ඇත. ඒ සඳහා පවතින ප්‍රධාන ගැටලුවක් වන්නේ ලොව පුරා බොහෝ රටවල ගංජා නීති විරෝධී භාණ්ඩයක් බවට පත්ව තිබීම ය. එම නිසා දුම්කොළ සමාගම් විසින් මෙම නීතිය වෙනස් කිරීමේ කූට උපක්‍රමයක් ලෙස ගංජා වැවීම සඳහා අවසර ලබා ගැනීමට කටයුතු කිරීම පෙන්වා දිය හැකිය.

දුම්වැටි සහ මද්‍යසාර භාවිතය නිසා අප රට තුළ දිනකට පුද්ගලයන් 100ක් පමණ අකල් මරණවලට පත්කරන අතර දුම්කොල සහ මද්‍යසාර සමාගම් දිනකට රුපියල් කෝටි 100ක පමණ මුදලක් ශ්‍රී ලාංකිකයන්ගෙන් සූරාගනු ලබයි. මෙම මත්ද්‍රව්‍ය නිසා අහිංසක දූ දරුවන් කාන්තාවන් ඉතා අසරණභාවයට පත්ව ඇත.

විශේෂයෙන් ශ්‍රී ලංකාව ආර්ථික, සමාජීය කරුණු ගණනාවකින් බැටකමින් සිටින අවස්ථාවක ගංජා වගාව කප් රුකක් ලෙස පෙන්වන මෙම නාට්‍යයේ ප්‍රතිඵලය අප තව දුරටත් මෙම අර්බුදය තුළ හිර කරමින් තව තවත් දුක්ඛිත තත්වයකට පත් කිරීම ය. තවත් මත්ද්‍රව්‍යයක් රට තුළ ප්‍රචලිත කර ශ්‍රී ලංකාව තව දුරටත් දුක්ඛිත තත්වයකට ඇද දැමීම වැළැක්වීම සඳහා අප වහාම ක්‍රියාත්මක විය යුතු බව මෙවර ලෝක මත්ද්‍රව්‍ය විරෝධී දිනයේ දී මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) තරයේ අවධාරණය කර සිටිමු.

**මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය.**
**2023.06.26.**